# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2024

2026 - මැයි

## **BCOME 3045** - ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව

ප්‍රශ්න සංඛ්‍යාව : (හයයි ) 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක - 01**

අ) වටිනාකම පිළිබඳ ශ්‍රම න්‍යාය බොහෝ ආර්ථික විද්‍යාඥයින් විසින් විවේචනය කරන ලද්දේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 03)

ආ) නූතන වෙළඳ න්‍යායන් බිහිවීම සඳහා සම්භව්‍ය වෙළඳ න්‍යායන් පදනමක් වූයේ කෙසේද?

(ලකුණු 07)

ඇ) පහත දැක්වෙන ජාත්‍යන්තර වෙළඳ න්‍යායන් ජාත්‍යන්තර වෙළඳාමේ වර්ධනයට බලපෑ ආකාරය පැහැදිලි කරන්න.

i. සාපේක්ෂවාසි න්‍යාය

ii. හෙක්ස්චර් - ඕලින් න්‍යාය

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක - 02**

අ) "වෙළඳ අනුපාතය" යන්න පැහැදිලි කර වෙළඳ අනුපාතය වැඩි වීමට හෝ අඩු වීමට හේතු වන සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) ශ්‍රී ලංකාව වැනි ආර්ථික අභියෝග වලට මුහුණ දෙන රටවල් ආර්ථික ස්ථාවරත්වය ළඟා කර ගැනීම සඳහා ඔවුන්ගේ භාණ්ඩ හා සේවා ආනයනය කළමණාකරණය කළ යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක - 03**

අ) සාපේක්ෂ වාසි මූලධර්මය යෝජනා කරන ලද්දේ කව්රුන් විසින් දැයි සඳහන් කර එය ඉදිරිපත් කරන ලද කාලසීමාව කුමක්දැයි දන්වන්න.

(ලකුණු 03)

ආ) නිරපේක්ෂ වාසි සහ සාපේක්ෂ වාසි මූලධර්ම අතර වෙස හඳුනා ගන්න.

(ලකුණු 06)

ඇ) වෙළඳාම සඳහා පදනමක් නිර්මාණය කිරීමට සාපේක්ෂ වාසිය පිළිබඳ මූලධර්මය උපකාරී වූයේ කෙසේද?

(ලකුණු 05)

ඈ) සාපේක්ෂවාසි මූලධර්මය උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක - 04**

අ) ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම, ශ්‍රී ලංකාවේ වරණීය වෙළඳ ප්‍රතිපත්තියේ වැදගත් ලක්ෂණයක් වන්නේ අයි ?

(ලකුණු 06)

ආ) ශ්‍රී ලංකාව වරණීය වෙළඳ ගිවිසුම් වලට එළඹීමට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රසාරණයට බලපාන්නේ කෙසේද?

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක - 05**

අ) බහු පාර්ශික වෙළඳ සංවිධානවල කාර්යභාරය කුමක්ද?

(ලකුණු 05)

ආ) " ප්‍රපාතනය " වැළැක්වීම සඳහා රජයට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) වෙළඳාමට ඇති තීරුබදු නොවන බාධක පහක් නම් කර ඒ සෑම එකක්ම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක - 06**

අ) ලෝක වෙළඳ සංවිධානය පිහිටුවීමට හේතු වූ සාධක මොනවාද ?

(ලකුණු 08)

ආ) පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

i. නිදහස් වෙළඳ ප්‍රදේශ

ii. පොදු වෙළඳපොල

iii. ආර්ථික සංගම්

(ලකුණු 6 x 2 = 12 )

**(මුළු ලකුණු 20)**